පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ.

**<u>පොලිස් ස්ථානාධිපතිවරයා විසින්, ඔහුගේ නිල කාමරය තුලදී, පහරදීම හා අවමන් සහගත සැලකිලි වලට භාජනය කිරීම.</u>**

තිඹිරියලාගේ තිලකරත්න පීරිස්, අවුः 57 යි, ජා.හැ.අ.663452029v, අවිවාහක, ගොවිතැන.
ලිපිනය : 27, කුමාරකන්ද, මාගල්කන්ද පාර, මග්ගොන.
දූ.අ. 0788337579
2024.04.10 දින්දීය.

මට විරුද්ධව ඇර තිබූ ව්‍යාජ පැමිණිල්ලකට, කරන ලද කැඳවීම මත, 2024.04.24 දින, පෙ:ව:10 ට, පයාගල පොලිස් ස්ථානයට ගොස් ඉදිරිපත් වුනා.

දෙපාර්ශවයේ කරුණු විමසා, සමථවීමට එකග වුනා. ඒ අතර, ස්ථානාධිපති වරයා, දෙපාර්ශවය කැඳවා, මමත්, පැමිණිලි පාර්ශවයත් ස්ථානාධිපතිගේ නිල කාමරයට ගියා. මා ඔහු ඉදිරිපිට තිබූ අසුන්වල එකක වාඩිවීමට සූදානම් වුනා. ආවේශ වූ ස්ථානාධිපති, අසභ්‍ය වචන කියමින්, උඹට වාඩිවෙන්න කිව්වේ කවුද අසමින්, අසුනින් නැගිට, මාගේ බෙල්ලෙන් අල්ලා තල්ලුකරගෙන ගොස් බිත්තියේ හප්පා, අතින් බෙල්ලට පපුවට පහර දුන්නා.

පොලිසියෙන් පිටවූ වහාම මා නාගොඩ මහා රෝහලට පැමිණ, මට පහරදීම පිලිබඳව වෛද්‍යවරයාට ප්‍රකාශ කලා. මාව 32 වාට්ටුවට ඇතුලත් කලා. පෝස් මුරපොලෙන් විස්තර ගත්තා. අධිකරණ වෛද්‍ය නිලධාරී පරීක්ෂා කලා. 2024.04.05 ටිකට් කැපුවා.

මා ඉල්ලා සිටින්නේ, පයාගල පොලිසියේ ස්ථානාදිපතිවරයා විසින්, ඔහුගේ නිල කාමරය තුල අසභ්‍ය වචන කියමින්, බැණ වදිමින්, පහරදීම මගින් සිදුකරන ලද වධහිංසා පැමිණවීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගන්නා ලෙසටය.

මෙයට,

තිඹිරියලාගේ තිලකරත්න පීරිස්